**ශීර්ෂය 18 - පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ කාර්යාලය**

---

## 1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 1.1 <u>තත්ත්වාගණනය කළ මතය</u>

පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ කාර්යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ කාර්යාලට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූළධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 <u>තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම</u>

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 <u>මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම්</u>

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ

සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වු ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම් ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ කාර්යාලය විසින් ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව, අවසන් භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන ඇමුණුම් ලෙස මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන ඇමුණුම් ලෙස මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතු වීම. | ඉදිරියේදී නියමිත ලෙස ඇමුණුම ඉදිරිපත් කරනු ලැබේ. |

### 1.6.2 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/**2018** දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව හඳුන්වා දී ඇති ආකෘතින් අනුව මූල්‍ය ප්‍රකාශනවල වටිනාකම් හා තොරතුරු ඇතුළත් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේ ඒසීඒ-එෆ් ආකෘතිය යටතේ වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ආදායම් නොවන ලැබීම් යටතේ අත්තිකාරම් ලැබීම් ලෙස දැක්විය | අත්තිකාරම් ලැබීම් ලෙස දක්වා තිබූ රු.2,122,766 ක වටිනාකම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි අදායම් නොවන ලැබීම් යටතේ ඇතුළත් කළ යුතු වීම. | ඉදිරියේදී නිවැරදි ලෙස සඳහන් කරනු ඇත. |

| | | | |
|---|---|---|---|
| | යුතු රු.2,122,766 ක වටිනාකම ඇතුළත් කර නොතිබුණි. | | |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ ලැබී තිබූ එකතුව වූ රු.195,076 ක වෙනත් ලැබීම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වෙනත් ලැබීම් යටතේ සටහන් නොකර භාණ්ඩාරයෙන් ලැබූ අග්‍රිම ලෙස ගිණුම් ගත කර තිබුණි. | වෙනත් ලැබීම් ලෙස දක්වා තිබූ වටිනාකම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වෙනත් ලැබීම් යටතේ ඇතුළත් කල යුතු වීම. | “බී” ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් වශයෙන් මෙම ලැබීම් සඳහන් කිරීමේ වෙනත් ක්‍රමවේදයක් හඳුනාගෙන නැත. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ මූල්‍ය ප්‍රකාශනවල ඒසීඒ-එෆ් ආකෘතිය යටතේ වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වම්පස තිරුවෙහි 2018 වර්ෂයේ අයවැය සංඛ්‍යාත්මක අගයන් දැක්වීම වෙනුවට වර්ෂය අවසානයට සලසා ගෙන තිබුණු ශුද්ධ ප්‍රතිපාදන වටිනාකම ඇතුළත් කර තිබුණි. ඒ හේතුවෙන් මුළු වියදම් රු.3,600,000 කින්ද පුනරාවර්තන වෙන්කිරීම් අගය රු.600,000 කින්ද වැඩිපුර දක්වා තිබුණි. | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ අදාළ ඇස්තමේන්තු ගත වටිනාකම් ඇතුළත් කළ යුතු වීම. | එකඟ වෙමි. |
| (ඈ) | 2017 දෙසැම්බර් 13 දිනැති අංක 259/2017 රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 09 ඡේදය ප්‍රකාරව පසුගිය වර්ෂය වෙනුවෙන් පිළියෙල කර ඉදිරිපත් කර තිබුණු මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වූ සටහන 6,7,8,9 තීරු වල දක්වා තිබූ වටිනාකම් සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශවල මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ 2017 වර්ෂයට අදාළව දක්වා තිබුණු වටිනාකම්වලට සමාන නොවුණි. | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල පෙර වර්ෂයට අදාල වටිනාකම් ඇතුළත් කිරීමේදී එම වටිනාකම් පෙර වර්ෂයේ වටිනාකම් හා සමාන විය යුතු වීම. | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි ඉකුත් වසර (2017) සම්බන්ධ අදාල සටහන් වල මුද්‍රණ දෝෂ සිදු වී ඇත. |

**1.6.3 <u>මූල්‍ය තත්ත්ව ප්‍රකාශය</u>**

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 ජනවාරි 01 දිනට මූල්‍ය ප්‍රකාශනවල ඒසීඒ-6 ආකෘතියේ දක්වා තිබූ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය අනුව 2018 ජනවාරි 01 දිනට යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණවල වටිනාකම රු.42,208,774 ක් වුවද, 2018 ජනවාරි 01 දිනට ආයතනයේ සිගාස් වැඩසටහන අනුව එම ශේෂය රු.56,707,950 ක් වූයෙන් වෙනස රු.14,499,176 ක් විය. එම වෙනස 2018 වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ අගය වෙනස් වීමේ ලාභ/අලාභ තීරුවට ගලපා තිබුණි. | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ වර්ෂයේ ආරම්භක ශේෂය ආයතනයේ සිගාස් වැඩසටහන අනුව පිළියෙල කරන ලද වත්කම් ශේෂයන් හා සමාන විය යුතු වීම. | එකඟ වෙමි. |
| (ආ) | මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශය අනුව 2018 ජනවාරි 01 දිනට වෙනත් යන්ත්‍ර හා උපකරණවල ශේෂය රු.6,278,673 ක් වූ නමුත් ආයතනයේ සිගාස් වැඩසටහන අනුව ශේෂය රු.989,417 ක් වූයෙන් රු.5,289,256 ක වෙනසක් පැවතුණි. | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ වර්ෂයේ ආරම්භක ශේෂය ආයතනයේ සිගාස් වැඩසටහන අනුව පිළියෙල කරන ලද වත්කම් ශේෂයන් හා සමාන විය යුතු වීම. | එකඟ වෙමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරණු ලබන වත්කම් වාර්තාව (ASSEST REPORT) කාර්යාලය විසින් ලබාගෙන නොමැති බැවින් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය සමඟ සිගාස් වැඩසටහන අනුව පිළියෙල කරන ලද වත්කම් ශේෂයන් සැසඳිමට නොහැකි විය. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරණු ලබන වත්කම් වාර්තාව සමඟ මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශවල ශේෂයන් සැසඳිය යුතු වීම. | එකඟ වෙමි. |

### 1.6.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සේවයේ නියුතුව සිට 2018 අගෝස්තු 20 දින කොළඹ මහ නගර සභාව වෙත ස්ථාන මාරු වී ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු එකතුව රු.188,250 ක ආපදා ණය හා උත්සව අත්තිකාරම් ණය ශේෂය 2018 දෙසැම්බර් 31 වන විටත් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 1 ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මෙම ණය ශේෂය නිරවුල් කරන ලෙස කොළඹ මහ නගර සභාවේ නාගරික කොමසාරිස් වෙත 2018 දෙසැම්බර් 20 දින දැනුම් දී ඇත. |

### 1.6.5 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **ලැබෙන චෙක්පත්, මුදල් ඇණවුම් ආදිය සඳහා වූ ලේඛනය** | | |
| චෙක්පත්, මුදල් ඇනවුම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 451 හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව ජී.ඒ.එම්.83 දරන පෝර්මය පරිදි ලැබෙන චෙක්පත්, මුදල් ඇණවුම් සටහන් කර ගැනීමට හැකිවන පරිදි ලේඛනයක් පවත්වා ගත යුතු වේ. | සෘජුවම මුදලින් කරන ලැබීම් මුදල් සහකාර වෙත ලැබෙන අතර ඔහු විසින් මෙම අවස්ථාවේදීම පොදු 172 කුවිතාන්සිපත් නිකුත් කරනු ලබයි. තැපැලෙන් ලැබෙන චෙක්පත්, මුදල් ඇණවුම් **GAM 83** ලේඛණයේ ඇතුළත් කරනු ලබයි. |

**1.6.6 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| නිරීක්ෂණය | නිර්දේශය | කාර්යාලයේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | එකඟ වෙමි. ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. |

**1.6.7 නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවීම | | |
| (අ) | 2008 ජනවාරි 01 දිනැති අංක 1530/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද, 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 සහ 6 වගන්ති | සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු.1,920,779 ක් වූ වවුචර් 23 ක නියැදියකට ගෙවීම් කිරීමේදී අදාල මුද්දර ගාස්තු අයකර ගෙන නොතිබුණි. | වවුචර් සඳහා ගෙවීම් කිරීමේදී මුද්දර ගාස්තු අයකර ගැනීම පිළිබඳ අවධානය යොමු කළ යුතු වීම. | 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 සහ 6 වැනි වගන්ති ප්‍රකාරව මුද්දර ගාස්තු නිසි පරිදි අය කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රන්තික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 139(4), 260, සහ 264 හි සඳහන් විධිවිධාන | එකතුව රු.1,856,581 ක වවුචර් 43 ක නියැදියකට ගෙවීම් කිරීමේදී වුවවරයේ සඳහන් දළ මුදල ලැබුණු බවට අදායකයාගේ අනන්‍යතාවය තහවුරු කරගෙන නියමිත තැනැත්තාටම මුදල් ගෙවූ බවට සාක්ෂි නොතිබුණි. | වවුචරයේ සඳහන් දළ මුදල් ලැබුණු බවට ආදායකයාගෙන් සනාථ කිරීමක් ලබාගත යුතු වේ. | ආදායකයාගේ අනන්‍යතාවය තහවුරු කරමින් නියමිත තැනැත්තාටම මුදල් ගෙවීමට ඉදිරියේදී නිවැරදිව කටයුතු කරනු ලැබේ. |
| (ඇ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 6 ඡේදය, 2009 ජුනි 17 දිනැති අංක 09/2009(I) චක්‍රලේඛය හා 2017 අප්‍රේල් 19 දිනැති අංක 03/2017 දරන චක්‍රලේඛය. | නිත්‍ය රාජකාරී වේලාවෙන් පසුව ගෙවනු ලබන දීමනා සඳහා කාලය පදනම් කර ගන්නේ නම් එම කාලය ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර මගින් සනාථ කළ යුතු වුවත් එසේ කිරීමකින් තොරව රු.795,000 ක දීමනා ගෙවා තිබීම. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිත කළ යුතු වීම. | නිත්‍ය රාජකාරී වේලාවෙන් පසුව ගෙවනු ලබන දීමනා විධිමත් පරිදි 2018 ජනවාරි සිට නොවැම්බර් දක්වා ගෙවීම් කර ඇති බව වැඩිදුරටත් දන්වමි. |

\

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2018 නොවැම්බර් 21 දිනැති අංක **267/**2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.4 ඡේදය අනුව, සටහන් අංක iii යටතේ වන බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය භාණ්ඩාගාරය විසින් එක් එක් වියදම් ශීර්ෂවලට අදාලව නිකුත් කරනු ලබන බැදීම් හා බැරකම් ප්‍රකාශය සමග එකග විය යුතු අතර එලෙස වාර්තා නොකල කිසිදු බැදීමක් හෝ බැරකමක් පෙර වර්ෂයේ වියදමක් ලෙස 2019 වර්ෂයේදී නිරවුල් නොකල යුතුය. එසේ වුවත්, 2018 මූල්‍ය ප්‍රකාශනවල බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය සටහන iii හි දක්වා තිබුණු බැරකම් රු.129,122 ක් භාණ්ඩාගාරය විසින් එක් එක් වියදම් ශීර්ෂවලට අදාලව නිකුත් කරනු ලබන බැදීම් හා බැරකම් ප්‍රකාශයෙහි දක්වා නොතිබියදී 2019 ජනවාරි මාසයේදී නිරවුල් කර තිබුණි. | බැදිම් හා බැරකම් ප්‍රකාශයේ දක්වා ඇති වටිනාකම භාණ්ඩාගාරය විසින් එක් එක් වියදම් ශිර්ෂවලට අදාලව නිකුත් කරනු ලබන බැදීම් හා බැරකම් ප්‍රකාශය සමග එකඟ විය යුතු වීම. | එකඟ වේ. ඉදිරියේදී භාණ්ඩාගාරයේ එකඟතාවය ඇතිව නිවැරදිව කටයුතු කරනු ලැබේ. |
| **(ආ)** 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ සටහන iv හි( බැරකම් පිළිබඳ ප්‍රකාශය (i) මු.රෙ 94(2) සහ (3) ප්‍රකාරව එළඹෙන ලද) රු.123,032 ක බැරකම් දක්වා නොතිබුණි. | මු.රෙ 94(2) හා (3) ප්‍රකාරව වර්ෂය තුළ එළඹ තිබූ බැරකම් බැරකම් පිළිබඳ ප්‍රකාශයේ ඇතුළත් කල යුතු වීම. | මෙම බැරකම් විස්තර පෙර වසර වල විසර්ජන ගිනුම් සැකසිමේදී සිදු කල ලෙස සටහන **iii** යටතේ සඳහන් කර ඇත. |

## 2.2 වියදම් කළමණාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) පුනරාවර්තන වැය විෂයයන් 07 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජන කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 12ක සිට සියයට 94ක් දක්වා පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වේ. | ස්ථිර කාර්ය මණ්ඩලයේ තනතරු පුරප්පාඩු 05 2018 වසර පුරා පැවතීම, 2019 වසර සඳහා විසර්ජන පනත ඉදිරිපත් නොකිරීම හේතුවෙන් වැටුප සමඟ අමතර දීමනා ගෙවීමට සිදු නොවීම මෙම ඉතිරියට හේතු වී තිබුණි. |
| (ආ) 2018 වර්ෂය තුළ පරිපූරක ඇස්තමේන්තුවක් මඟින් එක් වැය විෂයයක් සඳහා රු.600,000 ක ප්‍රතිපාදන ලබා ගෙන තිබූ නමුත්, 2018 දෙසැම්බර් 31 දිනට එම වැය විෂයයෙහි රු.629,623 ක ඉතිරියක් පැවතුණි. | -එම- | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තනතුර අහෝසි වීම හේතුවෙන් 2018 සැප්තැම්බර් මස සිට එම ඉන්ධන දීමනා (වැටුප සමඟ ගෙවනු ලබන) ගෙවීමට සිදු නොවීම මෙම ඉතිරියට හේතු වී තිබුණි. |
| (ඇ) මූලධන වැය විෂයයන් 03 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජන කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 12ක සිට සියයට 75ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි. | -එම- | තනතුරු පුරප්පාඩු පැවතීම. 2019 විසර්ජන පනත ඉදිරිපත් නොකිරීම හේතුවෙන් කාර්ය බහුලත්වය අවම වීමෙන් නව මිලදී ගැනීම්වලින් තොරව පැරණි උපකරණ තවදුරටත් උපයෝගී කර ගැනීමට හැකි වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.5(1)(ඇ) යටතේ දක්වා ඇති අවස්ථානුගත කරුණු සපුරා ලන්නේ නම් මිස කිසිම රජයේ නියෝජ්‍ය ආයතනයක් ස්වංක්‍රීය ලෙස සෘජු කොන්ත්‍රාත් ක්‍රමය සඳහා සුදුසුකම් නොලබයි. එහෙත් සෘජු කොන්ත්‍රාත් ක්‍රමය උචිත නොවන විටදී එම ක්‍රමය භාවිතා කර අවස්ථා 07 කදී රජයේ නියෝජ්‍යායතනයකින් රු.245,310 ක මිලදී ගැනීම් සිදුකර තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3(1)(ඇ) අනුව කටයුතු කළ යුතු වේ. | අදාල මිලදී ගැනීම රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව මඟින් සෘජුව මිලදී ගෙන ඇති අතර, රාජ්‍ය ආයතනයක් වන එම ආයතනය මඟින් මිලදී ගැනීම හරහා විනිවිද හා රජයට අලාභයක් ඇති නොවන පරිදි මිලදී ගැනීම සිදු කර ඇත. ඉදිරියේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.5(1)(ඇ) පරිදි කටයුතු කරනු ලැබේ. |

### 3.2 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 ජුලි 10 දින මෝටර් රථයකට හදිසි අනතුරකින් සිදුවූ අලාභය වූ රු.16,000 ක වටිනාකට මූල්‍ය ප්‍රකාශන සමඟ වූ සටහන (ii) හි සඳහන් වර්ෂය තුළ මු.රෙ 109 යටතේ වන පොතෙන් කපා හැරීම හා අයකර ගැනීම පිළිබඳ ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මේ දක්වා කපා හැරීමක් සිදු කර නොමැති බැවින් මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් කර නොමැත. |